**සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය - 2020**
**-----------------------------------------------**

**සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර, 2016 දෙසැම්බර් 28 දින එළඹී අංක 5915-එල් කේ දරණ මූල්‍ය ගිවිසුමේ II බී (3) පරිච්ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාල සීමාව**
**-----------------------------------------------------------------------**

**ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය මෙන්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙසින්ද මුදල් අමාත්‍යාංශය ක්‍රියා කරනු ලැබේ. ශ්‍රී ලංකාව තුළ දුප්පත් හා අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල ප්‍රයෝජනය සඳහා සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන්වල සමානාත්මතාව, කාර්යක්ෂමතාව හා විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා දායක වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක 03 කින් සමන්විත වන අතර, ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි 4.2.3 ඡේදයට අනුව, ව්‍යාපෘතියේ මතය ඉදිරිපත් කිරීමේ වාර්තා, එක් එක් සංරචකයේ කාර්යසාධනය මත පදනම්ව වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතු වේ. මෙම මූල්‍ය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය, එක්සත් ජනපද ඩොලර් මිලියන 75 කට සමාන රුපියල් මිලියන 11,212.50 ක් වී තිබුණු අතර, ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැයම ජාත්‍යන්තර සංවර්ධන සමායතනය විසින් ලබාදීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2017 ජනවාරි 01 දින ආරම්භ කර තිබුණු අතර, එය 2022 මාර්තු 31 දින වනවිට අවසන් කිරීමට නියමිතව ඇත.**

**1.3 මතය**
**------**

**මාගේ මතය අනුව මේ සමඟ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනයන් තුළින්, 2020 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් පිළිබිඹු කෙරෙන අතර සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වියදම් පිළිබඳ ප්‍රකාශය සහ ඊට අදාල මුදල් ප්‍රවාහයන්ද පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කර ඇත.**

**1.4 මතය සඳහා පදනම**
**-------------------**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් වන විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත වන බව මාගේ විශ්වාසයයි.**

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**
**-----------------------------------------------------------------------------------**

**මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.**

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ. මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ ක්‍රියකාරකම්වල භෞතික සහ මූල්‍ය ප්‍රගතිය

ව්‍යාපෘතියේ කාර්යයන්, සංරචක තුනකට බෙදා වෙන්කර තිබුණු අතර එම සංරචක වල භෞතික සහ මූල්‍ය ප්‍රගතිය ඉතාමත් අඩු මට්ටමක පැවතුණි. ලබා ගත හැකිවූ තොරතුරු වලට අනුව, එම සංරචක සම්බන්ධයෙන්වූ නිරීක්ෂණ පහත පරිදි වේ.

| සංරචක | සංරචකයේ අපේක්ෂිත ප්‍රතිඵලය | විගණන ගැටළු | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| (අ) ඒකාබද්ධ සමාජ ලේඛනාධිකාරයක් ගොඩනැගීම. | සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවීම සහ පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම. | 2017 වර්ෂයේදී සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවා තිබුණද; එය අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක වී නොතිබුණි. මණ්ඩලයේ සභාපතිවරයා 2019 දෙසැම්බර් 06 දින සිය ධූරයෙන් ඉල්ලා අස්වී තිබුණු බව තවදුරටත් අනාවරණය වු අතර, නව සභාපතිවරයෙකු පත්කිරීමේ කටයුතු විගණිත දිනය වු 2020 මැයි 26 දින වනවිටත් සිදුකර නොතිබුණි. | එකඟ වේ. | සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා සභාපතිවරයකු පත් කිරීමට සහ ප්‍රධාන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා කඩිනම් පියවර ගත යුතු වේ. |
| | සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ වැඩසටහන්වලට ඇතුළත්වීම, අනුමත කිරීම, ප්‍රකාශයට පත්කිරීම හා ඉන් ඉවත්වීම සම්බන්ධයෙන් විධිමත් ප්‍රතිපත්තියක් සකස් කිරීම. | විගණිත දිනය වු 2021 මාර්තු 23 දින දක්වාම, නව සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා පාර්ලිමේන්තුවෙන් සහ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගැනීමට ව්‍යාපෘතියට නොහැකි වී තිබුණි. | 2019 නොවැම්බර් මස තුළදී පාර්ලිමේන්තුව විසුරුවා හැරීම හේතුවෙන් නියාමනය කරන ලද යෝජනා ක්‍රමය අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නොහැකි වී තිබුණි. | සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අදාළ ගැසට් නිවේදනය අනුමත කිරීම සඳහා අදාළ පාර්ශවයන් වෙත බලපෑම් කිරීමට පියවර ගත යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) ඒකාබද්ධ සේවා සැපයුම් පද්ධතිය | සුදුසුකම් සම්බන්ධයෙන් වූ නිර්ණායක පදනම් කරගෙන, සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභීන් තෝරා ගැනීම. | 2019 ජූනි 20 දින ප්‍රකාශයට පත්කරන ලද ගැසට් පත්‍රයේ අදාළ සුදුසුකම් සම්බන්ධයෙන් වූ නිර්ණායකයන් පිළිබඳව සඳහන් කර තිබුණද, මෙම ගැසට්පත්‍රය පාර්ලිමේන්තුව විසින් අනුමත කර නොතිබුණි. නිර්ණායක පදනම් කරගත් තෝරාගැනීම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම මෙතෙක් ආරම්භ කර නොතිබුණි. | පාර්ලිමේන්තුව විසුරුවා හැරීම හේතුවෙන් ගැසට් පත්‍රය අනුමත කරගෙන නොතිබුණු අතර, උපයෝජනය හා බැඳුණු දර්ශක වෙනස් කොට එම ලේඛනය ප්‍රතිව්‍යුහගත කොට තිබුණි. | වගකිව යුතු පාර්ශවයන් දැනුවත් කිරීම සඳහා පියවර ගත යුතුවන අතර, ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳව සමීප අධීක්ෂණයක් කළ යුතු වේ. |
| | ව්‍යාපෘතිය වෙනුවෙන් තාක්ෂණික සහය සපයන ඒකකයක් පිහිටුවීම. | සංරචක - 02 හි ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සඳහා ව්‍යාපෘතිය වෙනුවෙන් තාක්ෂණික සහය සපයන ඒකකයක් සමෘද්ධි දෙපාර්තමේන්තුව තුළ පිහිටුවිය යුතු බව, විදේශීය දූත මණ්ඩලය විසින් පෙර වර්ෂයේදී උපදෙස් දෙන ලදී. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ තාක්ෂණික සහය සපයන ඒකකයක් පිහිටුවීම සඳහා ව්‍යාපෘති කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි. | - | තාක්ෂණික සහය සපයන ඒකකයක් පිහිටුවීම සඳහා කඩිනම් පියවර ගත යුතු වේ. |

## 2.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන ගැටළු | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
| --- | --- | --- |
| (අ) ලබාදී ඇති තොරතුරුවලට අනුව පවත්නා සමාජ ආරක්ෂණ උපායමාර්ග සහ ශ්‍රී ලංකාවේ ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ග සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 14.1 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත කොන්ත්‍රාත්තුවක් 2019 ජනවාරි 22 දින උපදේශන සේවා සමාගමක් වෙත පවරා තිබුණු අතර, එම කොන්ත්‍රාත්තුව 2019 සැප්තැම්බර් 01 දින වනවිට අවසන් කිරීමට නියමිත වී තිබුණි. විගණිත දිනය වූ 2021 මාර්තු 23 දින දක්වාම අදාළ වැඩ කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිට අදාළ උපදේශන සමාගම වෙත රුපියල් මිලියන 1.41 ක මුදලක් ගෙවා නිම කොට තිබුණි. | එකඟ වේ.<br>විවිධ කරුණු හේතු කොටගෙන ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ග සංවර්ධනය කිරීමේ කටයුතු ප්‍රමාද වී ඇත. මල්ටිටෙක් සොලියුෂන්ස් ආයතනය විසින් සපයන ලද කෙටුම්පත් තක්සේරු වාර්තාව සමාලෝචනය කිරීම සඳහා මාස හතරකට වැඩි කාලයක් ගත වී ඇත. ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් මෙම කටයුත්තේ ඇති හිඩැස් හඳුනාගෙන තිබුණු අතර, එම නිරීක්ෂණ පිළිබඳව වූ අදහස්, උපදේශකවරුන් හා සමාලෝචන කමිටුව සමඟ ඒකාබද්ධ වූ පොදු මණ්ඩපයක්දී හැකි ඉක්මණින් සාකච්ඡාවට භාජනය කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් දැනුවත් කිරීම සඳහා පියවර ගත යුතු වන අතරම, ක්‍රියාකාරකම් කඩිනම් කිරීම සඳහා ද ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන සවිබල ගැන්වීමේ වැඩසටහන සඳහා වැඩිදියුණු කිරීමේ උපායමාර්ග සංවර්ධනය සඳහා වන කොන්ත්‍රාත්තුව රු. මිලියන 2.4ක ඇස්තමේන්තුගත පිරිවැයකට පුද්ගල උපදේශකවරයෙකු වෙත පිරිනමා තිබුණි. ගිවිසුම අනුව, ඇගයීම් වාර්තාව සහ වැඩිදියුණු කිරීමේ උපායමාර්ග පිළිබඳ මුල් කෙටුම්පත් වාර්තාව කොන්ත්‍රාත් දින සිට සති 15 තුළ ඉදිරිපත් කළ යුතුය. සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු. මිලියන 240,000ක් ගෙවා තිබුණද, නිශ්චිත කාලය තුළ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වේ. වාර්තා 2019 ජූලි 09 දින ලබාදී ඇති අතර 2019 ජූලි 24 දින රු. මිලියන 2.5ක ගෙවීමක් සිදු කර ඇත. | කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් අවශ්‍යතා සමඟ අනුකූලවීමට කොන්ත්‍රාත්කරුවන් පෙළඹවීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |